SriLankan Airlines

## වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍යාංශය

ශ්‍රීලංකන් ගුවන් සමාගම, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ, කටුනායක, ශ්‍රී ලංකාව

**ප්‍රසම්පාදන අංකය : ENG/ALC/RFP/23/028**

**ශ්‍රීලංකන් ගුවන් සමාගම විසින් පටු බඳ ගුවන්යානා එකක් (01) මෙහෙයුම් කුලී පදනම මත ලබාගැනීමට යෝජනා කැඳවීම**

ශ්‍රීලංකන් ගුවන් සමාගම වෙනුවෙන් මෙහෙයුම් කුලී පදනම මත සුදුසු ගුවන්යානා සැපයීමට සුදුසුකම් ලත් සහ අවසරලත් ලංසුකරුවන්ගෙන් වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍යාංශයේ අමාත්‍ය මණ්ඩල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා විසින් ලංසු කැඳවනු ලැබේ. අදාළ යෝජනා සඳහා ඉල්ලීම (RFP) ශ්‍රීලංකන් ගුවන් සමාගමේ නිල වෙබ් අඩවිය (**https://www.srilankan.com/en_uk/corporate/tender-notices**) වෙතින් 2023 මැයි 22 වැනිදා සිට ලබාගත හැක.

මෙම ලංසු කැඳවීම සිදුකරනු ලබන්නේ ශ්‍රී ලංකා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුගතව අන්තර්ජාතික තරඟකාරී ලංසු ප්‍රසම්පාදන ක්‍රියාවලියක් මගිනි. ගුවන්යානා කල්බදු පදනම මත ලබාදීමට නීතිමය අවසර ඇති සියලු ලංසුකරුවන්ට **asset@srilankan.com** යන විද්‍යුත් ලිපිනය හරහා තම ලංසු ඉදිරිපත් කළ හැක. ලංසු ඉදිරිපත් කිරීමේදී අදාළ යෝජනා සඳහා ඉල්ලීම් පරිශීලන කේතයවන ENG/ALC/RFP/23/028 යොදා 2023 ජූනි 12 වැනි දින (ලංසු භාරගන්නා අවසාන දිනය) ශ්‍රී ලංකා වේලාවෙන් පැය 1400ට පෙර (GMT +0530) අදාළ ලංසු ලැබීමට සැලැස්විය යුතු ය.

නිවැරදිව සම්පූර්ණ කරන ලද ලංසු කැඳවීමේ පත්‍රිකාව, යෝජනා සඳහා ඉල්ලීම (RFP) සමඟ අමුණා **rfpinfo@srilankan.com** යන විද්‍යුත් ලිපිනය වෙත ලැබීමට සැලැස්විය යුතු ය. යෝජනා සඳහා ඉල්ලීමට අදාළ යම්කිසි විමසීමක් වේනම්, **rfpinfo@srilankan.com** යන විද්‍යුත් ලිපිනය වෙත 2023 ජූනි 07 දිනට හෝ ඊට පෙර යොමුකළ හැක.

ලංසු 2023 ජූනි 12 වැනිදා ශ්‍රී ලංකා වේලාවෙන් පැය 1415ට (GMT+0530) ඉලෙක්ට්‍රොනිකව විවෘතවන අතර, ඒ පිළිබඳ යම් වෙනස්වීමක් වේනම් අදාළ යෝජනා සඳහා ඉල්ලීමට අතිරේකයක් මගින් දැනුම් දෙනු ලැබේ. ප්‍රමාද වී ඉදිරිපත් කෙරෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ලංසු කැඳවීමට සහභාගිවීමට අපේක්ෂාකරන පාර්ශ්ව ඒ පිළිබඳව ලංසු විවෘත කිරීමට දින හතකට (7) පෙර ඒ බව **rfpinfo@srilankan.com** යන විද්‍යුත් ලිපිනය වෙත දැනුම් දිය යුතු ය.

යෝජනා සඳහා ඉල්ලීමට අදාළ යම් සංශෝධනයක්/ දැනුම්දීමක් වේනම් ශ්‍රීලංකන් ගුවන් සමාගමේ නිල වෙබ් අඩවිය හරහා දැනුම් දෙනු ලැබේ.

**සභාපති**
**අමාත්‍ය මණ්ඩල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව**
**වරාය, නාවික සහ ගුවන් සේවා අමාත්‍යාංශය**
**අංක 19, චෛත්‍යය පාර, කොළඹ 01, ශ්‍රී ලංකාව**